# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2301/44 - 2022 ඔක්තෝබර් මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2022.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය: ම/සං/ගැමි රජය/ඉ/අත්පත්
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4/3/2/2012/HA/291

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතෙන් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුවේ සුළු කොට්ඨාසයේ බලිවිල ගමේ මැනුම්පති විසින් පිළියෙළ කර ඇති මූලික පිඹුරු අංක 4292 සහ 2022.05.05 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0477ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ලට:

1. **කැබැලි අංක 01**

ඉඩමේ නම: අඹගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් පිහිටා ඇත; හිමිකම් කියන අය: රදාවාන බලිවිල නො. 82හි පදිංචි එම්. පී. ජයසේකර සහ මියගිය එම්. පී. බේබි සිංඤෝගේ උරුමකරුවන් වන එම්. පී. ගිරිගෝරිස් අප්පුහාමි සහ ආර්. කේ. රත්නායක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0477

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 ඔක්තෝබර් මස 26 වැනි දින, පෙ. ව. 10.30ට මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 ඔක්තෝබර් මස 19 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජී. එස්. අයි. විමලසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහර.

2022 ඔක්තෝබර් මස 13 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10-0106


1A - G 37765 – 12 (2022/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*